සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා

තොරතුරුවලට ප්‍රවේශ වීමේ පටිපාටිය

- පනත - **2016** අංක **12** දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- බලාත්මක වීමේ දිනයන් නියම කිරීම - **2017** ජනවාරි **20** දිනැති අංක **2002/42** දරන අති විශේෂ ගැසට් පත්‍රය
- නියෝග - **2017** පෙබරවාරි **03** දිනැති අංක **2004/66** දරන අති විශේෂ ගැසට් පත්‍රය
- රීති - **2017** පෙබරවාරි **17** දිනැති අංක **2006/43** දරන අති විශේෂ ගැසට් පත්‍රය
- පොදු අධිකාරිය - සෞඛ්‍ය අමාත්‍යාංශය
- පනත හා නියෝග - **www.documents.gov.lk** වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉහත පනත යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ තොරතුරු ලබාගැනීම සඳහා පනතේ සඳහන් තොරතුරු නිලධාරියා වෙත RTI 01 දරන අයදුම්පත්‍රය මඟින් අයදුම් කල හැක. මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.**

තොරතුරු ලබාගැනීමට ඉල්ලුම් කිරීම

1 තොරතුරු ලබාගැනීමට ලිඛිත RTI 01 අයදුම්පත්‍රය හෝ ලිපියක් වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත යොමු කර එය ලැබුණු බවට ලිපියක් ලබා ගන්න.

2 ඔබේ ඉල්ලීමට අදාල තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව හැකි ඉක්මනින් කෙසේ වුවද දින 14 ක් තුළ දන්වනු ලැබේ.

3 ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තිරණය කළහොත් කොමිෂන් සභාව නියම කළ ගාස්තුවක් ගෙවිය යුතු නම් එය දන්වා එවනු ඇත. තොරතුරු ලබාගැනීමට ගෙවීමක් කළයුතු නම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14 ක් තුළ තොරතුරු ලබාදෙනු ඇත.

4 ගාස්තු ගෙවීමෙන් පසු දින 14 ක් තුළ තොරතුරු ලබාදීම අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින් දින 21 කට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබාදෙනු ඇත.

5 තොරතුරු ලබාගැනීම සඳහා වන ඉල්ලීම් යම් පුරවැසියෙකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48 ක් තුළ සිදුකරනු ඇත.

6 තොරතුරු ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාලව,

- තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම.
- පනතේ 5 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබාදීම ප්‍රතික්ෂේප කිරීම.
- පනත මඟින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම
- සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම
- වැඩිපුර ගාස්තු අය කිරීම
- ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම
- එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශකර හෝ අස්ථානගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම

මත අතෘප්තියට පත්වන්නේ නම්, පහත නම් සඳහන් කළ නිලධාරියා වෙත දින 14 ක් තුළ අභියාචනයක් ඉදිරිපත් කරන්න.

නම්කළ නිලධාරියා

**කේ.එම්.වත්සලා ප්‍රියදර්ශණී**

අතිරේක ලේකම්(පාලන) 2

සෞඛ්‍ය අමාත්‍යාංශය,

අංක 385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,

කොළඹ 10.

දුරකථන අංකය -011-2681034

Fax No – 011-2681034

e mail – addsecadmin@health.gov.lk

අමාත්‍යාංශයේ එක් එක් අංශ නියෝජනය කරන තොරතුරු නිලධාරීන්ගේ විස්තර

| අංක | තොරතුරු නිලධාරියාගේ නම,තනතුර හා රාජකාරි ලිපිනය | දුරකථන අංකය | තොරතුරු ලබාගත හැකි ක්ෂේත්‍ර |
|---|---|---|---|
| 01 | වයි.එල්.එම්. නවාවි මහතා<br>අතිරේක ලේකම් (ප්‍රසම්පාදන),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>මෙඩි හවුස් ගොඩනැගිල්ල,<br>ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | 011-2675118 | ඖෂධ මිලදීගැනීම්වලට අදාල ප්‍රසම්පාදන කටයුතු (රු.මිලියන 100-250 දක්වා)<br>ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාල ප්‍රසම්පාදන<br>අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් හා ආයතනවල අමු ආහාර මිලදී ගැනීම් ප්‍රසම්පාදන කටයුතු<br>වෛද්‍ය උපකරණ හා හදිසි ඖෂධ මිලදී ගැනීම්වලට අදාල ප්‍රසම්පාදන කටයුතු<br>අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් හා ආයතනවල අනෙකුත් ප්‍රසම්පාදන කටයුතු |
| 02 | සුනිල් ගලගම මහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2672542 | රෝහල්වල ක්‍රියාත්මක කෙරෙන විදේශ ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු |
| 03 | වෛද්‍ය පී.ඩබ්.සී.පනාපිටිය මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(වෛද්‍ය සේවා)I,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2693674 | විශේෂඥ වෛද්‍යවරුන්, පරිපාලන ශ්‍රේණි වෛද්‍යවරුන් පශ්චාත් වෛද්‍ය විද්‍යා පුහුණුවීම් ලබන වෛද්‍යවරුන්,සීමාවාසික වෛද්‍යවරුන්, ලියාපදිංචි සහකාර වෛද්‍යවරුන් පිළිබඳව |
| 04 | වෛද්‍ය ජී.විජේසූරිය මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(වෛද්‍ය සේවා)II<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2691711 | ශ්‍රේණි වෛද්‍යවරුන්ගේ සියලු පරිපාලන කටයුතු (විශේෂඥ ශ්‍රේණිය දක්වා උසස් කිරීම්/ස්ථිර කිරීම්/විශ්‍රාම ගැන්වීම්/විදේශ නිවාඩු,භාෂා දීමනා අනුමත කිරීම/වාහන බලපත්‍ර නිර්දේශ කිරීම/තනතුර හැරයාමේ නිවේදන නිකුත් කිරීම/නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ කිරීම්/ස්ථාන මාරුවීම්)<br>පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන්ගේ පත්වීම් ලබාදීම/ වෛද්‍යවරුන්ගේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් කරනු ලබන විමසීම්වලට පිළිතුරු සැපයීම<br>වෛද්‍යවරුන්ගේ මූලික ලිපිගොනුව සකස් කිරීම<br>වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල පැවැත්වීම හා සම්බන්ධ කටයුතු සිදු කිරීම<br>පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීම<br>ප්‍රාථමික සත්කාර සෞඛ්‍ය සේවා ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම<br>ප්‍රාථමික සත්කාර සේවා වැඩිදියුණු කිරීම<br>ලෝක සෞඛ්‍ය සංවිධානය හා අනෙකුත් විදේශීය අරමුදල් මඟින් සිදු කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම<br>ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් කරනු ලබන ප්‍රාථමික සත්කාර සේවා සම්බන්ධ වැඩසටහන් මෙහෙයවීම<br>බන්ධනාගාර රෝහල් වල සෞඛ්‍ය සේවා කටයුතු සම්බන්ධීකරණය කිරීම/අධීක්ෂණය හා නියාමනය කිරීම/මානව සම්පත් පුහුණු කිරීම<br>බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය වෙමින් බන්ධනාගාර සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම.පෞද්ගලික වෛද්‍ය ආයතන සම්බන්ධ නියාමන කටයුතු සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| 05 | ආර්.එන්.වික්‍රම ආරච්චි මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)I,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2692815 | රියදුරු, ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ(**PL03)** , ප්‍රාථමික ශිල්පීය නොවන නිලධර ගණයේ **(PL01)**තනතුරුවලට බඳවාගැනීමේ සිට විශ්‍රාම ගන්වන තෙක් ආයතන හා පරිපාලන කටයුතු කිරීම<br>සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වැටුප් ලබාගන්නා සියලුම නිලධාරීන්ගේ හා සේවක මහතුන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, විශ්‍රාම ගැන්වීම අග්‍රහාර රක්ෂණ කටයුතු හා පරිපාලන කටයුතු<br>අමාත්‍යාංශ වාහන අලුත්වැඩියා, ඉන්ධන ඇණවුම් ලබාදීමේ කටයුතු,යතුරුපැදි මිලදීගැනීම හා බෙදාහැරීම, වාහන රක්ෂණ කටයුතු<br>පහත වැටුප් කාණ්ඩවලට අයත් තනතුරුවල පරිපාලන කටයුතු<br>**MN02,MN03,MN04,MN05,MN06,MN07,MT01,MT08**<br>**SL01**(ඉංජිනේරු, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී,නීති නිලධාරී,ගණකාධිකාරී, විද්‍යාත්මක සේවයේ තනතුරු) |
| 06 | චාමික එච්. ගමගේ මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)II,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ10 | 011-2674967 | හෙද පාලන කටයුතු/හෙද නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග හා බඳවා ගැනීමේ විභාග |
| 07 | ජී.ඩබ්.සී.එස්.ප්‍රියභාෂිණී මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන)III,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2693632 | පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවලට අදාල තනතුරුවලට බඳවාගැනීමේ සිට විශ්‍රාම ගන්වන තෙක් ආයතන හා පරිපාලන කටයුතු කිරීම<br>රෝහල්වලට අනුයුක්ත කල පසු රෝහල් හා ආයතනවලින් ලැබෙන ආයතන හා පරිපාලන ලිපි සම්බන්ධව කටයුතු කිරීම<br>**MN 01** හා **PL 02** තනතුරුවට බඳවාගැනීමේ සිට විශ්‍රාම ගන්වන තෙක් ආයතන හා පරිපාලන කටයුතු කිරීම |
| 08 | වෛද්‍ය එම්.ජේ.එස්.සී. සමරකෝන් මිය , නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(අධ්‍යාපන,පුහුණු හා පර්යේෂණ),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2692213 | ඉදිරියේදී සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් මේ දක්වා පවත්වා ඇති පුහුණු වැඩසටහන් හා ඒ සම්බන්ධයෙන් රජය විසින් දරා ඇති වියදම්<br>ඒකකය යටතේ පාලනය වන හෙද,පරිපූරක හා අතුරු වෛද්‍ය පාඨමාලා සඳහා ඇතුළත්ව දැනට පුහුණුව ලබන සහ පුහුණුව නිම කරන ලද පුහුණුලාභීන් පිළිබඳසංඛ්‍යාත්මක අගයන්<br>පුහුණු පාසැල්වල ආචාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු<br>උක්ත පුහුණු පාඨමාලා යටතේ පුහුණුව නිමකළ පුහුණුලාභීන් ගේ කුසලතා ලේඛන(ලකුණු රහිත)<br>ඒකකය මඟින් ලබාදුන් ප්‍රතිපාදන යටතේ මෙතෙක් සිදු කරන ලද වෛද්‍ය පර්යේෂණ සංඛ්‍යාව හා ඊට අදාලව රජය විසින් දරා ඇති වියදම් |

| | | | |
|---|---|---|---|
| 09 | වෛද්‍ය ටී.බී.ආනන්ද ජයලාල් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(දන්ත සේවා),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2693180 | මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳ විස්තර<br>දන්ත ශල්‍ය වෛද්‍යවරුන් බඳවාගැනීම් පිළිබඳ විස්තර<br>දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ ස්ථානමාරුවීම් පිළිබඳ විස්තර<br>ජංගම දන්ත වෛද්‍ය සායන පිළිබඳ විස්තර<br>මුඛ සෞඛ්‍ය සත්කාර සේවා සැපයීම් |
| 10 | වෛද්‍ය ජී.එස්.කේ.ධර්මරත්න මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(රසායනාගාර සේවා),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2673138 | රජයේ රෝහල්වල කරනු ලබන රසායනාගාර පරීක්ෂණ පිළිබඳ විස්තර<br>එම රසායනාගාර පරීක්ෂණාගාර පරීක්ෂණ පිළිබඳ රෝගියා සෑහීමකට පත් නොවන්නේ නම් ඒ පිළිබඳ විමසීම් |
| 11 | වෛද්‍ය එස්.සී.වික්‍රමසිංහ මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(බෝ නොවන රෝග)සෞඛ්‍ය අමාත්‍යාංශය<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2686393 | බෝ නොවන රෝග<br>පිළිකා රෝග<br>මානසික රෝග |
| 12 | වෛද්‍ය වී.ටී.එස්.කේ.සිරිවර්ධන මහතා,නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාරිසරික .වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂණය),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය, මෙඩි හවුස් ගොඩනැගිල්ල,<br>ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | 011-2672004 | පාරිසරික සෞඛ්‍ය<br>වෘත්තීය සෞඛ්‍ය<br>ආහාර ආරක්ෂණ |
| 13 | වෛද්‍ය එස්.ශ්‍රීධරන් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2679997 | මානව සම්පත් තොරතුරු<br>සෞඛ්‍ය සැලසුම්කරණය සම්බන්ධ තොරතුරු හා පුරෝකතන<br>විදේශ ශිෂ්‍යත්ව<br>සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන සම්බන්ධ තොරතුරු<br>සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතා හා පෙන්නුම් කරන මිනුම් දඬු සම්බන්ධ තොරතුරු |
| 14 | වෛද්‍ය ඩී.ආර්.කේ.හේරත් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(වෛද්‍ය සැපයීම්),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2694113 | රජයේ රෝහල්වල ඖෂධ, උපකරණ හා රසායනික ද්‍රව්‍යවල උපයෝජ්‍යතාව<br>එම ඖෂධ, උපකරණ හා රසායනික ද්‍රව්‍යවල ගුණත්වය |
| 15 | ජී.එස්.කරුණාරත්න මහතා<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී 1(වැ.බ),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2693384 | සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මුදල් හා ප්‍රතිපාදන සම්බන්ධ තොරතුරු<br>සෞඛ්‍ය අමාත්‍යාංශයේ කරන ලද ගෙවීම් සම්බන්ධ තොරතුරුසෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල විගණන විමසුම්වලට අදාල තොරතුරු |
| 16 | වෛද්‍ය එස්.එම්.ආනල්ඩ් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(මහජන සෞඛ්‍ය සේවා)1,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2694077 | බරවා මර්ධන වැඩසටහන/ලාදුරු මර්ධන වැඩසටහන, මැලේරියා මර්ධන වැඩසටහන<br>වසංගත රෝග විද්‍යාංශ ඒකකයේ කටයුතු<br>ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන<br>ක්ෂය රෝග මර්ධන හා ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන<br>ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්ධන වැඩසටහන<br>පශු වෛද්‍ය සේවා කටයුතු/නිරෝධායන ඒකක වැඩසටහන,විශේෂිත වැඩසටහන්,<br>ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා වසංගතය පැඩලීම සඳහා වන විශ්ව අරමුදල විදේශ ව්‍යාපෘති **(GFATM)** |

| | | | |
|---|---|---|---|
| | | | හඳුනා නොගත් වකුගඩු රෝගය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහන ශක්තිමත් කිරීමේ වැඩසටහන |
| 17 | වෛද්‍ය සුසී පෙරේරා මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(මහජන සෞඛ්‍ය සේවා)II<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2674682 | මාතෘ හා ළමා සෞඛ්‍ය<br>සෞඛ්‍ය අධ්‍යාපනය<br>වතු සෞඛ්‍ය<br>ආබාධිත සත්කාර<br>පෝෂණය |
| 18 | ටී.එම්.දිසානායක මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>(විමර්ශන),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>මෙඩි හවුස් ගොඩනැගිල්ල,<br>ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | 011-2675824 | මූලික විමර්ශන පිළිබඳව<br>විධිමත් විමර්ශන වාර්තා පිළිබඳව |
| 19 | සුදත් රත්නවීර මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (හදිසි වැටලීම්),<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>මෙඩි හවුස් ගොඩනැගිල්ල,<br>ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | 011-2675846 | හදිසි වැටලීම් වාර්තා සහ ඊට අදාල තොරතුරු<br>මූලික විමර්ශන වාර්තා<br>මූලික විමර්ශන වාර්තාවලට අදාල තොරතුරු |
| 20 | ටී.ඊ.හෙට්ටිආරච්චි මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>( පාලන),සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2670405 | සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම<br>අතිරේක ලේකම්(වෛද්‍ය සේවා), අතිරේක ලේකම්(මහජන සෞඛ්‍ය සේවා),සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ තනතුරු<br>ගරු අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩල පත්කිරීම්සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ<br>සියලුම ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධ ආයතනික කටයුතු<br>මහජන පෙත්සම් කාරක සභා ආංශික අධීක්ෂණ කාරක සභාව සම්බන්ධීකරණ කටයුතු |
| 21 | ඒ.ආර්.අහමඩ් මිය<br>ප්‍රධාන නීති නිලධාරිනි,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2694404 | අමාත්‍යාංශ නීති කටයුතු සම්බන්ධයෙන් |
| 22 | වෛද්‍ය ඩබ්.කේ. වික්‍රමසිංහ මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,වැ.බ.<br>ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ 10. | 011-2698443 | ශ්‍රී ලංකා ජාතික රෝහලේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් හා අනෙකුත් තොරතුරු |
| 23 | වෛද්‍ය සුදත් සමරවීර මහතා<br>අධ්‍යක්ෂ, ජාතික ඩෙංගු මර්ධන ඒකකය<br>555/5, ඇල්විටිගල මාවත,<br>නාරාහේන්පිට, කොළඹ 05. | 011-2368416 | ඩෙංගු රෝගය පිළිබඳ තාක්ෂණික කරුණු<br>ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය හා වාර්තාවීම්<br>මදුරු මර්ධන වැඩසටහන් සම්බන්ධ දත්ත<br>කීට විද්‍යා දත්ත |
| 24 | වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මිය<br>අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය<br>231,ද සේරම් පෙදෙස, කොළඹ 10. | 011-2696508 | උපත් හා ළදරු මරණ සංඛ්‍යාලේඛන<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මගින් සිදුවන සත්කාර / ළමා, පාසල් හා යොවුන් විය සෞඛ්‍ය පහසුකම් /පවුල් සෞඛ්‍ය හා කාන්තා සෞඛ්‍ය පහසුකම්<br>ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයේ වගකීම්<br>මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ රජයේ |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රතිපත්ති,ක්‍රමෝපායන් හා මාර්ගෝපදේශ<br>පවුල් සංවිධාන, ස්ත්‍රී පුරුෂභාවය හා කාන්තා සෞඛ්‍ය |
| 25 | වෛද්‍ය චාර්ලිස් නුගවෙල මහතා, අධ්‍යක්ෂ, වකුගඩු ඒකකය,349,ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10. | 011-2422355 | වකුගඩු රෝග වළක්වා ගැනීම,ප්‍රතිකාර කිරීම,කාන්දුකරණය සහ බද්ධ කිරීම්වලට අදාල තොරතුරු<br>වකුගඩු රෝගීන් සඳහා ප්‍රතිකාර නොවන ප්‍රතිලාභයන්<br>හේතුව සොයා නොගත් වකුගඩු රෝගයට අදාල තාක්ෂණික කරුණු<br>වකුගඩු රෝගයට ප්‍රතිකාර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රමවේදය<br>ජාතික වකුගඩු මධ්‍යස්ථානයට අදාල අනෙකුත් තොරතුරු |
| 26 | වෛද්‍ය ඊෂානි ප්‍රනාන්දු මිය අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්ධන වැඩසටහන<br>555/5, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05. | 011-2368627 | පිළිකා නිවාරණයහා මර්දනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායාත්මක සැලැස්ම සම්බන්ධ තොරතුරු<br>ජාතික පිළිකා මර්දන වැඩසටහන,එහි ව්‍යුහය,කාර්යමණ්ඩලය සහ එම ආයතනය මගින් සිදු කරනු ලබන සේවාවන්<br>පිළිකා රෝග කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය,නාරාහේන්පිට මගින් ලබාගත හැකි සේවා සම්බන්ධ තොරතුරු<br>ජාතික පිළිකා ලේඛනය(**National Cancer Registry**)සම්බන්ධ තොරතුරු (එක් එක් වර්ෂයේ වාර්තා වූ පිළිකා රෝගීන් පිළිබඳ දත්ත)<br>පිළිකා රෝග පිළිබඳ මූලික තොරතුරු, පිළිකා රෝග වළක්වා ගැනීම සහ කලින් හඳුනා ලැනීම පිළිබඳ තොරතුරු |
| 27 | වෛද්‍ය ජී.කේ.පී.දර්ශන මහතා සභාපති ,විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,සීදූව | 011-2258861<br>64 | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල සම්බන්ධයෙන් තොරතුරු |
| 28 | වෛද්‍ය ඇලන් ලුඩෝවයික් මහතා සභාපති , දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ,11 වෙනි මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. | 011-2187140 | දුම්කොල හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සම්බන්ධයෙන් තොරතුරු |
| 29 | මහාචාර්ය එස්.ඩී.ජයරත්න මහතා සභාපති , ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,තලපත්පිටිය, නුගේගොඩ | 011-2778621 | රෝහල් සේවාවන් හා ගාස්තු පිළිබඳ විස්තර<br>ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව<br>රෝහල් සේවාවන් පිළිබඳ දත්ත<br>කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු<br>යම් රෝගියෙකුගේ ප්‍රතිකාර පිළිබඳව එම රෝගියාට පමණක් විස්තර ලබාදීම |
| 30 | එච්.එම්.එන්.දිනිප්‍රිය මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැපයීම්), සෞඛ්‍ය අමාත්‍යාංශය,<br>385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2692382 | ගොඩනැගිලි ඉදිකිරීම්<br>යන්ත්‍රෝපකරණ නඩත්තු<br>පිරිසිදුකිරීමේ සේවා සැපයීම<br>ආරක්ෂක සේවා පවත්වා ගැනීම<br>සන්නිවේදන නඩත්තු |

| | | | |
|---|---|---|---|
| 31 | වෛද්‍ය දේදුනු ඩයස් මහතා, අධ්‍යක්ෂ,වෛද්‍ය පර්යේෂණ ආයතනය,බොරැල්ල,කොළඹ 08 | 011-2693532 | වෛද්‍ය පර්යේෂණ ආයතනය සම්බන්ධ තොරතුරු |
| 32 | වෛද්‍ය ටී.කේ. කළුබෝවිල මහතා, අධ්‍යක්ෂ , ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,කළුතර | 034-2222682 | ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට අදාළ තොරතුරු |
| 33 | වෛද්‍ය එච්.ඩී.බී.හේරත් මහතා, ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, නො.31,නොරිස් කැනල් පාර,කොළඹ 10 | 011-2691848 | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට අදාළ තොරතුරු |
| 34 | එස්.ඒ.ජේ.කරුණාතිලක මහතා අධ්‍යක්ෂ, ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය, ද සේරම් පෙදෙස, කොළඹ 10. | 011-2691916 | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට අදාළ තොරතුරු |
| 35 | යූ.ඒ.එස්.එච්.සිසිර කුමාර මහතා,ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ), සෞඛ්‍ය අමාත්‍යාංශය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. | 011-2670182 | ප්‍රවෘත්ති හා ප්‍රචාරණ සම්බන්ධයෙන් |
| 36 | වෛද්‍ය එස්.ඩී.යූ.එම්. රංග මහතා අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, කරාපිටිය | 091-2232268 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 37 | වෛද්‍ය එම්.එම්.එස්.එන්.මනතුංග මහතා ,අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල, මහමෝදර | 091-2222261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 38 | වෛද්‍ය චන්දන කැඳන්ගමුව මහතා අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල, කුරුණෑගල | 0372223919 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 39 | වෛද්‍ය එම්.ඩී.ඒ.රොඩ්රිගෝ මහතා ,අධ්‍යක්ෂ, මහ රෝහල, රත්නපුර | 045-2222260 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 40 | වෛද්‍ය ඒ.ඩී.යූ. කරුණාරත්න මහතා ,අධ්‍යක්ෂ,මහ රෝහල, මාතර | 041-2222444 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 41 | වෛද්‍ය උපුල් කරුණාරත්න මහතා, අධ්‍යක්ෂ, මහ රෝහල, බදුල්ල | 055-2222260 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 42 | වෛද්‍ය පී. කාර්තිකේයන්ප මහතා ,වෛද්‍ය අධිකාරී,මහ රෝහල, අම්පාර | 0632222261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 43 | වෛද්‍ය ඒ.එම්.එස්.වීරබණ්ඩාර මහතා අධ්‍යක්ෂ, සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ළමා රෝහල, පේරාදෙණිය | 081-2389115 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 44 | වෛද්‍ය මහේන්ද්‍ර සෙනවිරත්න මහතා ,වෛද්‍ය අධිකාරී,මහ රෝහල, නුවරඑළිය | 052-2224966 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 45 | වෛද්‍ය ඩී.එම්.එස්.සමරවීර මහතා අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල, අනුරාධපුර | 025-2222266 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 46 | වෛද්‍ය එච්.එම්.එස්.ටී. බංඩාර මහතා ,වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, කන්තලේ | 026-2234261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |

| | | | |
|---|---|---|---|
| 47 | වෛද්‍ය සුරංග උබේසේකර මහතා වෛද්‍ය අධිකාරී,මහ රෝහල, හම්බන්තොට | 047-2256408 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 48 | වෛද්‍ය ආර්.එම්.ඩී.රත්නායක ,වෛද්‍ය අධිකාරී,මහ රෝහල, මොණරාගල | 055-2276700 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 49 | වෛද්‍ය එම්.කේ.සම්පත් ඉන්දික කුමාර, අධ්‍යක්ෂ,මහ රෝහල, පොලොන්නරුව | 0272223095 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 50 | වෛද්‍ය ටී.ෂත්‍යමූර්ති මහතා, අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, යාපනය | 0212227351 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 51 | වෛද්‍ය කේ.කනේෂලිංගම් මිය අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, මඩකලපුව | 0652222376 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 52 | වෛද්‍ය ආර්.මුරලීස්වරන් මහතා, වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, කල්මුණේ උතුර | 067-2220525 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 53 | වෛද්‍ය ඒ.එල්.එෆ්.රහ්මාන් ,වෛද්‍ය අධිකාරී, අෂ්රොෆ් අනුස්මරණ රෝහල, කල්මුණේ | 0672223572 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 54 | වෛද්‍ය එම්.එච්.එම්.සනූෆර් මහතා ,වෛද්‍ය අධිකාරී, මූලික රෝහල අක්කරෙයිපත්තු | 067-2277163 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 55 | වෛද්‍ය අයි.ඩබ්.එම්.ජේ. වික්‍රමරත්න මහතා,වෛද්‍ය අධිකාරී,මහ රෝහල, ත්‍රිකුණාමලය | 0262222261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 56 | වෛද්‍ය ජී. විජේසූරිය මහතා ,අධ්‍යක්ෂ,රිජ්වේ ආර්යා ළමා රෝහල, කොළඹ 08 | 011-2693711<br>011-2691521 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 57 | වෛද්‍ය ඒ.ආර්.එම්. තවුෆික් මහතා ,අධ්‍යක්ෂ, ජාතික අක්ෂි රෝහල, කොළඹ 10 | 011-2696033 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 58 | වෛද්‍ය උපුලී විජේමාන්න මිය, ,අධ්‍යක්ෂ, ද සොයිසා කාන්තා රෝහල,කොළඹ 08 | 011-2694972 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 59 | වෛද්‍ය අජිත් දන්තනාරායන මහතා ,අධ්‍යක්ෂ,කාසල් වීදියේ කාන්තා රෝහල,කොළඹ 08 | 011-2696231<br>0112-696232<br>0112-695529 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 60 | වෛද්‍ය ඉරේෂා ප්‍රනාන්දු මිය ,අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල, මහනුවර | 081-2222137 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 61 | වෛද්‍ය එච්.එම්.අර්ජුන තිලකරත්න මහතා ,අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල, පේරාදෙණිය | 0812388015 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 62 | වෛද්‍ය සම්පත් ලියනගේ රණවීර මහතා ,අධ්‍යක්ෂ,උතුරු කොළඹ ශික්ෂණ රෝහල, රාගම | 0112-959261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 63 | වෛද්‍ය සාගරි කිරිවන්දෙණිය මිය ,අධ්‍යක්ෂ,දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල | 011-2764160<br>011-2763261<br>0112-767064 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |

| | | | |
|---|---|---|---|
| 64 | වෛද්‍ය වයි.එම්.මිහිරි ප්‍රියංගනී මිය, වෛද්‍ය අධිකාරී,මහ රෝහල, කෑගල්ල | 035-2222264 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 65 | වෛද්‍ය එස්.ඒ.ඒ.එන්. ජයසේකර මහතා අධ්‍යක්ෂ,අපේක්ෂා රෝහල,මහරගම | 011-2840488 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 66 | වෛද්‍ය ඩබ්.එම්.ඩී.එන්.කේ.විජේසිංහ මහතා, අධ්‍යක්ෂ, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය, මුල්ලේරියාව නව නගරය | 011-2578234 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 67 | වෛද්‍ය ප්‍රියන්ත කරුණාරත්න මහතා, වෛද්‍ය අධිකාරී,මූලික රෝහල, මුල්ලේරියාව | 011-2578276 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 68 | වෛද්‍ය.ප්‍රදීප් රත්නසේකර මහතා අධ්‍යක්ෂ, මහ රෝහල, කළුතර | 034-2222261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 69 | වෛද්‍ය දුමින්ද ඩයස් මහතා,.වෛද්‍ය අධිකාරී,මූලික රෝහල, ගම්පොළ | 081-2353397 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 70 | වෛද්‍ය කේ.පී.මල්ලවආරච්චි මහතා ,වෛද්‍ය අධිකාරී,මහ රෝහල, හලාවත | 0322222261 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 71 | වෛද්‍ය පී.ඩී. කොග්ගලගේ මහතා,වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, අංගොඩ.( අයි.ඩී.එච්) | 011-2411224 | අදාළ රෝහල සම්බන්ධයෙන් වන සියලු තොරතුරු |
| 72 | අරුණි සෝමරත්න මිය,ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,දේශීය වෛද්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශ උප කාර්යාලය, මෙඩි හවුස් ගොඩනැගිල්ල.ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 | 011-2112742 | i. ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>ii. ශ්‍රී ලංකා ආයුර්වේද, ඖෂධ සංස්ථාව<br>iii. ආයුර්වේද වෛද්‍ය සභාව<br>iv. ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය<br>v. ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල්<br>vi. හෝමියෝපති රෝහල වැලිසර<br>vii. හෝමියෝපති වෛද්‍ය සභාව<br>සම්බන්ධයෙන් වන තොරතුරු |
| 73 | වෛද්‍ය ආර්.එම්.එස්.කේ.රත්නායක මහතා, අතිරේක ලේකම්. ඖෂධ නිෂ්පාදනය,සැපයීම් හා නියාමන අංශය, අංක 525, යූනියන් පෙදෙස, කොළඹ 02. | 011-2103210 | ඖෂධ නිෂ්පාදන කලාප පිහිටුවීම,සම්බන්ධීකරණය හා අධීක්ෂණය.<br>"ස්වස්ථ" වෛද්‍ය සැපයුම් හා තොරතුරු කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.<br>පහත සඳහන් ආයතන අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම.<br>වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල<br>පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව<br>ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල<br>විජය කුමාරතුංග මහ රෝහල<br>දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය<br>1990 සුවසැරිය පදනම |
| 74 | ආචාර්ය යූ.ඒ.මෙන්ඩිස් මහතා සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, මෙහෙවර පියස, කිරුළ පාර, කොළඹ 05. | 011-2338500 | විවෘත වෙළඳපොළ වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය, මිලදී ගැනීම, විකිණීම හා බෙදා හැරීම.<br>සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂිත අයිතම ආනයනය කර සැපයීම.<br>ජීවනී, ග්ලූකෝස් සහ බෙන්සිල් බෙන්සොවේට් ක්‍රීම් නිෂ්පාදනය සහ අලෙවිය . |

| | | | |
|---|---|---|---|
| | | | රසායනාගාර පහසුකම් සැපයීම. |
| 75 | වෛද්‍ය පී.පී.ජී.පී.උත්පල ඉන්ද්‍රවංශ මහතා, සභාපති, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,11, සර් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන. | 011-2623238 | ඖෂධ නිෂ්පාදනය<br>වෛද්‍ය සැපයුම් අංශයට හා ලියාපදිංචි ඖෂධ බෙදාහැරීම් නියෝජිතයන් මඟින් ඖෂධ ශාලා වෙත ලබාදීම |
| 76 | සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, 120, නොරිස් කැනල් පාර,කොළඹ 10. | 011-2695173 | ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම.<br>ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම,ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, මිල නියම කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම.<br>ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සහ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම සහ ආනයනය කිරීමට අදාල සියලු කටයුතු විනිවිධභාවයකින් යුතුව තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදුකරන බවට තහවුරු කිරීම<br>ශ්‍රී ලංකාව තුළ නිවැරදි තත්ත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම.<br>ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ආරක්ෂාකාරී ලෙස හා විචාරශීලී ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.<br>ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අළෙවිකරණ නියාමනය කිරීම.<br>රට තුළ ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන පැවතීම නියාමනය කිරීම.<br>පශ්චාත් අලෙවිකරණ සමීක්ෂණ පැවැත්වීම.<br>සායනික පරීක්ෂණ පැවැත්වීමට අදාල සියලු කටයුතු නියාමනය කිරීම.<br>ඖෂධ නිෂ්පාදනය, ආනයනය,බෙදා හැරීම,ප්‍රවාහනය,මිලකරණය , තොග හා සිල්ලර වෙළඳාම, ඇවළඳ දැන්වීම් සහ ඖෂධ බැහැර කිරීම නියාමනය කර පාලනය කිරීම හා රට තුළ ලබා දී ඇති ඖෂධ හොඳ තත්ත්වයේ , කාර්යක්ෂම,ආරක්ෂිත සහ දැරිය හැකි මිලකට සහතික කිරීම.<br>වෛද්‍ය උපකරණ පිළිගත හැකි ගුණාත්මක බවත්,ආරක්ෂාවක් හා අපේක්ෂිත අරමුණු සඳහා සුදුසු බව සහතික කිරීම සහ එම වෛද්‍ය උපකරණ අධිකාරියේ ලියාපදිංචි කර නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම,නැවත ඇසුරුම් කිරීම, විකිණීම, බෙදා හැරීම,සහ ශ්‍රී ලංකාවේ විකිණීම සඳහා බලපත්‍ර ලබා දීම.<br>සීමාස්ථ නිෂ්පාදන යටතට ගැනෙනු ලබන සියලුම සෞඛ්‍යාරක්ෂණ නිෂ්පාදන හා විලවුන් වර්ග ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්ත්වයෙන් යුතු බවට සහතික කිරීම.<br>ඔසුසල් නියාමනය කිරීම. |

කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම.

1 නම් කළ නිලධාරියාගේ තීරණය හේතුවෙන් පීඩාවට පත්වීම මත හෝ පනතෙන් නියම කරනු ලබන කාලසීමාව තුළ එකී නිලධාරියාගෙන් තීරණයක් ගැනීමට අසමත් වීම මත ඕනෑම අභියාචකයෙකුට කොමිෂන් සභාව වෙතට මෙකී රීතිවල දැක්වෙන සාම්පල පෝරමයෙන් ඉල්ලා සිටින තොරතුරු ලබාදීම මගින් කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකිය.
2 අභියාචනය කොමිෂන් සභා කාර්යාලයේ ගොනු කළ යුතු අතර පුද්ගලිකව හෝ ලියාපදිංචි තැපැල මගින් ලබා දිය හැකිය.
3 අභියාචනයක් සාමාන්‍ය වශයෙන් සලකා බැලීම සඳහා මාස 2ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.
4 එබඳු අභියාචනයක් සත්‍ය පිටපත් බවට තමන් විසින් සහතික කළ පහත දැක්වෙන ලියකියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.
   - පනතේ 24 වන වගන්තිය යටතේ සිදුකල ඉල්ලීමේ පිටපතක්
   - තොරතුරු නිලධාරියාගෙන් යම් පිළිතුරක් ලැබුවේ නම් එම පිළිතුරේ පිටපතක්
   - පනතේ 31 වගන්තිය යටතේ නම් කළ නිලධාරියා වෙත සිදුකළ අභියාචනයේ පිටපතක්
   - නම් කළ නිලධාරියාගෙන් යම් පිළිතුරක් ලැබුවේ නම් එම පිළිතුරේ පිටපතක්
   - අභියාචක විසින් සුදුසු යැයි හැඟෙන ඔහුගේ හෝ ඇයගේ අභියාචනයට අදාළව ඉදිරිපත් කළ සෙසු ලියකියවිලිවල පිටපත්,ඒවායේ සුචියක් සමඟ
5 අභියාචනයක් අභියාචක විසින් පිටපත් දෙකකින් යුතුව ගොනු කළ යුතුය.
6 රීති (1-5) දක්වා ඇති කොන්දේසි තෘප්ත නොකරන්නේ නම් කොමිෂන් සභාව විසින් අභියාචනයක් සාමාන්‍ය වශයෙන් පිළිනොගනු ඇත.
7 මාස දෙකේ කාලපරිච්ඡේදය ඉක්මවා යාමෙන් පසුව වුවද, ඔහුගේ/ඇයගේ පාලනයෙන් බැහැරව හේතුවක් විසින් ඔහු/ඇය අභියාචනය ඉදිරිපත් කිරීමෙන් වළක්වා ඇති විටදී එකී අභියාචනය පිළිගැනීමට කොමිෂන් සභාවට හැකියාව ඇත.

කොමිෂන් සභාවේ ලිපිනය

සභාපති,

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව,

කාමර අංක 203-204,

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,

කොළඹ 07 .

දුරකථන අංකය +94 11 2691626

ගාස්තු ගෙවීම:

1. අයදුම්පත් ගාස්තු

1. කිසිදු පොදු අධිකාරියක්, පුරවැසියකු විසින් තොරතුරු ඉල්ලීමක් සිදුකිරීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ අයදුම්පතක් සැපයීමේදී කිසිදු ගාස්තුවක් අය නොකළ යුතුය
2. තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් මූලික කටයුතු කිරීම සඳහා කිසිදු පොදු අධිකාරියක් කිසිදු ගාස්තුවක් අයනොකළ යුතුය

2 තොරතුරු සඳහා ගාස්තු

අන් ලෙසකින් නියම කර ඇත්තේ නම් මිස, තොරතුරු ඉල්ලීමක් සඳහා ප්‍රතිචාර වශයෙන් තොරතුරු සැපයීම පිණිස පහත දැක්වෙන ගාස්තු පොදු අධිකාරියක් විසින් අයකරනු ලැබිය හැකිය.

(i) ඡායාපිටපත් ගැනීම :

(අ) A4 (සෙ.මී.21x සෙ.මී29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.2/- සහ එකම කොළයේ දෙපැත්ත රු.4/- ක් වේ.

(ආ) ලීගල් ප්‍රමාණයේ (සෙ.මී.21.59xසෙ.මී35.56) කඩදාසිය සහ A3 ප්‍රමාණයේ (සෙ.මී.29.7x සෙ.මී42) කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.4/- සහ එකම කොළයේ දෙපැත්ත රු.8/- ක් වේ.

(ඇ) ඉහත සඳහන් කල ප්‍රමාණයට වඩා විශාල කඩදාසියක සපයනු ලබන තොරතුරක් සඳහා සැබෑ වියදම අයකෙරේ.

(ii) මුද්‍රිත පිටපතක් ලබාගැනීම

(අ) A4 (සෙ.මී.21x සෙ.මී29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.4/- සහ එකම කොළයේ දෙපැත්ත රු8/- ක් වේ.

(ආ) ලීගල් ප්‍රමාණයේ (සෙ.මී.21.59xසෙ.මී35.56) කඩදාසියක සහ A3 ප්‍රමාණයේ (සෙ.මී.29.7x සෙ.මී42) කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.4/- සහ එකම කොළයේ දෙපැත්ත රු.8/- ක් වේ.

(ඇ) ඉහත සඳහන් කල ප්‍රමාණයට වඩා විශාල කඩදාසියක සපයනු ලබන තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

(iii) තොරතුරු ඉල්ලීම සිදුකරනු ලබන පුරවැසියා විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක් (Diskette) සංයුක්ත තැටියක් (Compact Disc) යූඑස්බී දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ එබඳු වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත තොරතුරු පිටපත් කරදීම පිණිස මේ එක් එක් අයිතමයක් සඳහා රු.20/- බැගින් අයකෙරේ.

(iv) පොදු අධිකාරිය විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක් (Diskette) සංයුක්ත තැටියක් (Compact Disc) යූඑස්බී දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ එබඳු වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත තොරතුරු පිටපත් කරදීම සඳහා සැබෑ වියදම අයකෙරේ.

(v) යම්කිසි ලියවිල්ලක් හෝ විෂයයක් පරීක්ෂා කරන්නේ නම් හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයක් පරීක්ෂාවට ලක්කරන්නේ නම් පැයකට රු.50/- බැගින් අයකරනු ලබන අතර,එකී අධ්‍යයනය/පරීක්ෂාව සඳහා පැයකට වඩා වැඩි කාලයක් ගතවන්නේනම් පළමු පැය සඳහා ගාස්තු අයනොකෙරේ. මෙය සිදු කරනුයේ නොමිලයේ එබඳු පරීක්ෂාවක් සිදු කිරීමට ඉඩසැලසූ පොදු අධිකාරීන්ගේ එකී භාවිතයට අගතියක් නොවන පරිදිය. තවද එකී පොදු අධිකාරීන්ගේ එකී භාවිතය මෙම උප රීතිය තිබියදී වුවද එසේම පවතිනු ඇත .

(vi) නියැදි (සාම්පල) හෝ ආකෘති (මොඩල) සඳහා සත්‍ය වියදම අයකෙරෙනු ඇත.

(vii) ඊ මේල් (විද්‍යුත් තැපැල) මගින් සපයනු ලබන තොරතුරු සඳහා ගාස්තු අය නොකෙරේ.

**3. චක්‍රලේඛ හෝ රීති වශයෙන් මීට පෙර නියම කල හෝ නිකුත් කල ගාස්තු උපලේඛනයක් යම්කිසි පොදුඅදිකාරියක් සතුව පවතියි නම්, 4 වන රීතියේ කුමක් සඳහන් වුවද එකී ගාස්තු උපලේඛනය දිගින් දිගටම ක්‍රියාත්මක වනු ඇත.**

මේ අනුව, දැනට පවත්නා ගාස්තු උපලේඛන සම්බන්ධයෙන් යම්කිසි ගැටුමක් ඇති වුවහොත්, ගාස්තු සහ අභියාචන පිළිබඳ මෙකී රීතිවලට අනුකූලව එබඳු තත්වයක්, කොමිෂන් සභාවෙන් නිශ්චය කලයුතු අභියාචනයකට විෂය විය හැකිය.

**4. ගාස්තුවකින් තොරව සපයනු ලබන තොරතුරු :**

(1) ඉහත සඳහන් කළ 4 වැනි රීතියේ කුමක් සඳහන් වුවද, පොදු අධිකාරය විසින් පිටු හතරක් (ඒ 4 ප්‍රමාණයේ) ප්‍රමාණයේ තොරතුරු අන්තර් ගත හෝ සකසන ලද ඡායා පිටපත් හෝ මුද්‍රිත පිටපත් ගාස්තුවකින් තොරව ලබා ගත යුතුය.

(2) සාමාන්‍යයෙන් ගාස්තුවකින් තොරව ලබා දිය හැකි තොරතුරු, තවදුරටත් ගාස්තුවකින් තොරව ලබා ගත යුතුය.

**5. ගාස්තු ගෙවීමේ ක්‍රමය :**

1. මෙකී රීති වලට අන් තැනෙක කුමක් සඳහන් වුවද, පොදු අධිකාරයට පහත දැක්වෙන ආකාරයට තොරතුරු සඳහා ගාස්තු අයකළ හැකිය.
    1. තොරතුරු නිලධාරියාට අත්පිට මුදල් වශයෙන්
    2. පොදු අධිකාරියේ ගිණුම් නිලධාරයා වෙත යොමු කල බැංකු අණකරයක් මගින්
2. ගාස්තු ගෙවීමේ ක්‍රමය කුමක් වුවද තොරතුරු නිලධාරියා විසින් එකී ගෙවීමට අදාලව රිසිට්පතක් නිකුත් කළ යුතුය.